


# අම්මා යන්නට ගියා ය

අම්මා යන්නට ගියා ය.
නැවත නොඑන්නටම යන්නට ගියා ය.

විප්‍රවාසී දරුවෝ පව්කාරයෝ ය. අම්මෙකුගේ තාත්තෙකුගේ අවසන් මොහොතේ වතුර උගුරක් පොවන්නට පින් නැති විප්‍රවාසී දරුවෝ පව්කාරයෝ ය. ඇපෙන් බේරෙන්නට මෙන් ඉඳහිට දවසක අම්මාට තාත්තාට දුරකතන ඇමතුමක් දෙන ඉඳ හිට කීයක් හෝ මුදලක් යවන අවුරුදු දෙක තුනකට වතාවක් ඔවුන් බලන්නට යන විප්‍රවාසී දරුවෝ තමන්ගේ විප්‍රවාසය නිසා ඒ දෙමාපියන් සිත් තුළ දැල්වූ වේදනාවේ ගින්න ගැන මඳකට හෝ නොසිතුවෝ ද?

අවුරුදු දහතුනකට පෙර අම්මා තාත්තා හැර දා ඕස්ට්‍රේලියාවට ආ දා සිට අම්මා මා වෙනුවෙන් කොයි තරම් කඳුලු වගුරන්නට ඇද්ද? ඈ මට ඕස්ට්‍රේලියාටව එවූ පළමු ලිපිය අදත් මා ළඟ ඇත. හැදූ වැඩූ දරුවන් ඈත්වීම අම්මෙකුගේ සිතේ කොපමණ වේදනාවක් ඇති කරනු ඇද්ද යන්න තහවුරු කරන්නට මේ ලිපියට වඩා සාක්ෂියක් අවශ්‍ය ද?

අවුරුදු දහතුනක් පෙරුම් පුරා මාස තුනක නිවාඩුවක් ගත කරන්නට අම්මා මා සමග ඕස්ට්‍රේලියාවට ආවේ පසුගිය මාර්තුවේදී ය. මගේ මෙල්බන් හිතවත්තු හිතවතියෝ අප්‍රමාණ වූ ගරු බුහුමනින් ඇගේ සිත මහත් ප්‍රබෝධයට පත් කළහ. ඔවුනට ඒ සත්කාර්යය අප්‍රමාණ පිනක් රැස්කරදෙනු ඇති බව නිසැක ය.

මෙල්බනයේ වීදි දිගේ අම්මා රෝද පුටුවක තබා තල්ලුකරගෙන ගිය අතින් ඉන් මාස දෙකකට පසු මම අම්මාගේ නිසල දේහය සහිත ලී පෙට්ටිය ඔසවාගෙන ගියෙමි. ඒ පෙට්ටිය මගේ උර මත තැබූ බර තවමත් මට දැනෙයි.



## පරාස්ස

නිශ්ශංක දිද්දෙණිය හිතවත් රංගධරයාගේ ආරාධනයෙන් ජෝන් ද සිල්වා රඟහලේ දී පරාස්ස නාට්‍යය නරඹන්නට ලැබීම භාග්‍යයක්



සිංහල ජන කතා වල නිතරෙ අසන්නට ලැබෙන ගමරාළ ගමහාමිනේ රාස්සයා වැනි චරිත වේදිකාව මත ප්‍රතිනිර්මාණය කෙරුණ පරාස්ස නාට්‍යය නැවත නිශ්පාදනය කිරීම කාරණා කීපයක් නිසාම වැදගත් ය කියා මට සිතෙයි. එක් අතකින් ශෛලිගත සම්ප්‍රදායේ නාට්‍ය අඩුවෙන් නිපදවෙන මෙවන් යුගයක එය ප්‍රතිනිර්මාණය වීමත් අනික් අතින් කාලයේ වැලි තලාවෙන් වැසී යමින් තිබෙන අපේ ජනකතා පිළිබඳ අපේ අවධානය නැවත යොමු කරවීමත් ඉතා වැදගත්.

නිශ්ශංක දිද්දෙණිය ජයලත් මනෝරත්න රෝහණ බැද්දගේ ශ්‍රියන්ත මෙන්ඩිස් මාධනී මල්වත්ත වැනි ප්‍රවීණ රංග ශිල්පීන්ගේ ප්‍රතිභාවෙන් ඔප් නැංවුණ රෝහණ දන්දෙණිය ගේ පරාස්ස ළබන මාසයේදී ඕස්ට්‍රේලියාවේ සංචාරයක යෙදෙයි. එය ඔබටත් ඔබේ දරුවනටත් අපූර්ව අත්දැකීමක් වන බව නම් නිසැකයි. දැන්ම ප්‍රවේශපතක් මිලට ගැනීම බුද්ධිමත්.

## ආදරණීය සංවාදයක්

ගිණිදැඩු හෙවන බීම භූමි නිශ්ශබ්ද වෙනු දොන් ජුවන් වැනි නාට්‍ය රසක් වේදිකාවට ගෙන ආ සුනිල් චන්ද්‍රසිරි ගේ ආදරණීය සංවාදයක් නාට්‍යය නැරඹුවේ ජනක කුඹුකගේ හිතවතාගේ ආරාධනයෙන්. ජනක කුඹුකගේ සාරංග දිසාසේකර සහ අනුරුද්ධ ගම්භීරආරච්චි ගේ රංගනයෙන් ද වසන්ත විට්ටච්චි ගේ අංග රචනයෙන්ද ඔප් නැංවුණ ආදරණීය සංවාදයක් නාඨ්‍යය මාරියෝ බෙනෙඩෙට්ටිගේ නාට්‍යයක සිංහල පරිවර්තනයයි.

විරුද්ධ මත දරන්නවුන් වධකාගාර වලට ගාල් කරන මෙවන් යුගයක ආදරණීය සංවාදයක් නාට්‍යයට කාලීන වටිනාකමක්ද ලැබෙයි. වධකාගාරයක වධකයකු හා ඔහුගේ වධයට පාත්‍රවන තරුණකු අතර සිදුවන සංව-ාදය අනුසාරයෙන් ගොඩ නැගෙන ආදරණීය සංවාදයක් නාට්‍යය බලකාමයෙන් මත්වුණ නිලධාරීන්ගේත් දේහපාලන සිරකරුවන්ගේත් අධ්‍යාත්මය වේදිකාව මත නිරුවත් කරයි. ජනක කුඹුකගේ සහ සාරංග දිසාසේ-කර ගේ ප්‍රාණවත් ප්‍රතිභාන්විත රංගනයෙන් දිහැරෙන සංවේදී මිනිසුන් දෙදෙනෙකුගේ කතාව - ආදරණීය සංවාදයක් නාට්‍යය ඔබත් නැරඹිය යුතු නාට්‍යයක් යයි

## මගෙ බිසව්නේ අසාපන් - නුඹ මන්ද්‍රිදේවි නොවුණේ



බූන්දි කණ්ඩායමේ අමිල චන්ද්‍රසෝම සොහොයුරාගෙ පියාගෙ මළගමට සහභාගි වෙලා අනිත් පැත්ත හැරෙන්නටත් පෙරම ලැබුණේ තවත් එවැනිම ශෝකජනක පණිවුඩයක්.

රත්න ශ්‍රී අයිය ගේ නෝනා හේමමාලි නැතිවෙලා..

අපි ගාල්ලට යනකොට මහ වැස්ස. කලින් වතාවෙ ගාල්ල කොටුව ඇතුලෙ තිබුණ රත්න ශ්‍රී අයියගෙ ගෙදරදි අපට තේ හදා දුන් ඒ අව්‍යාජ කාන්තාව - හේමමාලි - නිසලව වැතිර ඉන්න හැටි මොහොතක් බලා ඉඳලා ආපහු හැරුණා. රත්න ශ්‍රී අයියගේ කඳුළු පිරුණ ඇස් දිහා බලා ඉන්න බැරුව මං බිම බලා ගත්තා.

නිර්මාණකාරයකු පිටුපස සිට නිර්මාණාවේග සපයන ගැහැණියක ගැන උදාහරණයක් ඕනෙ නම් ඒකට හොඳම උදාහරණය තමයි හේමමාලි. රත්න ශ්‍රී ලිව්ව ගීත කොපමණ සංඛ්‍යාවක කවි කොපමණ සංඛ්‍යාවක ඇගේ හෙවණැල්ල වැටිල තිබුණ ද? ඈ ගැන කියන්න වචන කොයිතරම් අවශ්‍ය වෙනවද? ඒ සියලලම කැටි කරගත් මාලතී කල්පනා සොයුරියගෙ කවිය කවි පිටුවට ඇතුල් කරලා මං නිහඬ වෙනවා. මට කියන්න තියෙන බොහෝ දේ ඒ කවියෙ තියෙන නිසා.






මගේ මෑණියන් ගේ අභාවයේදී
අප හා ශෝකය බෙදා ගන්නට එක්වූ
හිතවත් ඔබ සැමට
අපේ ගෞරවය හිමිවෙයි

ශෝක පණිවුඩ මල් වඩම් එවූ
සියළු සංවිධාන හා හිතවතුන්ටත්

අවමංගල්‍යයට වැඩම කළ
රොක්බෑන්ක් පාරමී බෞද්ධ විහාරාධිපති
**පල්ලේවෙල දේවරක්ඛිත ස්වාමීන් වහන්සේ**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ
ගරු නියෝජ්‍ය කතානායක
**චන්ද්‍රිම වීරක්කොඩි**
පාර්ලිමේන්තු මන්ත්‍රී **නිශාන්ත මුතුහෙට්ටිගම**
ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ටත්

බස්නාහිර පළාත් සභාවේ අමාත්‍ය
**උපාලි කොඩිකාර** මහතා ඇතුළු
පළාත්සභා සහ ප්‍රාදේශීය සභා මන්ත්‍රිවරුනටත්

**විවිධ කලා ක්ෂෙත්‍ර නියෝජනය කළ හිතවත්**
**ඔබ සැමටත්**

අවමල්‍යයට හා වෙනත් කටයුතු වලට සහභාගි
වූ හිතවතුන් සැමදෙනාටත්

මෙපුවත බෙදාහළ සන්නස හා සිහනද
පුවත්පත් ඇතුලු ඔස්ට්‍රේලියාවේ හා ශ්‍රී ලංකාවේ
සියලුම මාධ්‍ය වල හිතවතුන්ටත්

### ස්තුතියි

මේ ශෝකජනක පණිවුඩය ලද මොහොතේ සිට
මා වටා රොක් වී
ශෝකය බෙදාගත්
ඕස්ට්‍රේලියාවේ අපේ හිතවතුන්ගේ සුහදතාව
කිසිදිනෙක අමතක නොවේ
මිනිස්කමේ ඒ ගුණ සුවඳ
සදා කල් අපේ සිත් තුළ
රැඳෙනු ඇති බව නිසැක ය

**ජගත් ජේ එදිරිසිංහ**